7/21

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2022 (2023)

# 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023)**
**General Certificate of Education (Ord. Level) Examination, 2022 (2023)**

| | | |
|---|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II | පැය තුනයි |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II | மூன்று மணித்தியாலம் |
| Business and Accounting Studies | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉංජිනේරුවරයෙකු වන නලින් ආචාර්ය උපාධිය නිමවා 'රෝස්විලා' නම් නවාතැනෙහි වාසය කරයි. ඔහු 'විජය සූර්ය කෝෂ' නමින් ගෘහස්ථ සූර්ය කෝෂ නිෂ්පාදනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සී/ස සන්පවර් පෞද්ගලික සමාගම අඛණ්ඩව සපයයි. සුපුන් නිෂ්පාදන කටයුතු සඳහා සහය වෙයි. නිෂ්පාදිත බෙදාහැරීම රුවන් සතු 'ටෙක්සිටි' සුපිරි වෙළෙඳසැල් ජාලය මගින් සිදු කරනු ලබයි.

**1.** ඉහත සිද්ධියෙහි නලින් සිය නිවාස අවශ්‍යතාව සපුරාගෙන ඇත්තේ
(1) විජය සූර්ය කෝෂ ව්‍යාපාරය මගිනි.
(2) ටෙක්සිටි සුපිරි වෙළෙඳසැල මගිනි.
(3) සී/ස සන්පවර් පෞද්ගලික සමාගම මගිනි.
(4) රෝස්විලා නවාතැන මගිනි.

**2.** විජය සූර්ය කෝෂ ව්‍යාපාරයේ බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නලින්, ටෙක්සිටි සුපිරි වෙළෙඳසැල
(2) රුවන්, සී/ස සන්පවර් පෞද්ගලික සමාගම
(3) සුපුන්, ටෙක්සිටි සුපිරි වෙළෙඳසැල
(4) සුපුන්, සී/ස සන්පවර් පෞද්ගලික සමාගම

**3.** ටෙක්සිටි සුපිරි වෙළෙඳසැල් ජාලය, විජය සූර්ය කෝෂ ව්‍යාපාරයට
(1) ශක්තියකි. (2) දුර්වලතාවකි. (3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

**4.** නලින්ගේ ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනය සඳහා නිදසුනක් වන්නේ
(1) ටෙක්සිටි සුපිරි වෙළෙඳසැල් ගොඩනැගිල්ල ය.
(2) සී/ස සන්පවර් පෞද්ගලික සමාගමේ ගොඩනැගිල්ල ය.
(3) රෝස්විලා නවාතැන ය.
(4) විජය සූර්ය කෝෂ ව්‍යාපාර ගොඩනැගිල්ල ය.

**5.** සී/ස සන්පවර් පෞද්ගලික සමාගම, විජය සූර්ය කෝෂ ව්‍යාපාරයට ඇල්මක් දැක්වීමට හේතුවක් වන්නේ
(1) ලාභාංශ ලබා ගැනීමට ය.
(2) අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමට ය.
(3) නිෂ්පාදිත සාධාරණ මිලකට ලබා ගැනීමට ය.
(4) ආයෝජනයේ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ය.

www.e-kalvi.com

6. වර්තමානයේ බොහෝ ව්‍යාපාර, හවුල් ව්‍යාපාරයකට වඩා සංස්ථාපිත සමාගමක් ලෙස පවත්වාගෙන යාමට රුචිකත්වයක් දක්වයි. මෙයට හේතුව වන්නේ
   (1) ලාභය බෙදී යාම ය.
   (2) අයිතිය බෙදී යාම ය.
   (3) අසීමිත වගකීම ය.
   (4) නෛතික පුද්ගලභාවය ය.

7. සීමාසහිත මැදගම විවිධ සේවා සමුපකාර සමිතිය ......①...... අංශයේ ......②...... ව්‍යාපාර සංවිධානයකි.
   ඉහත ① හා ② ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) පෞද්ගලික, ලාභ අරමුණු කර ගත්
   (2) පෞද්ගලික, ලාභ අරමුණු කර නොගත්
   (3) පොදු, ලාභ අරමුණු කර ගත්
   (4) පොදු, ලාභ අරමුණු කර නොගත්

8. චෙක්පත් සම්බන්ධ ගනුදෙනුවල දී වාණිජ බැංකුව සෑම විට ම,
   (1) අණකරු වේ.
   (2) අණලද්දා වේ.
   (3) ආදායකයා වේ.
   (4) පිටසන්කරු වේ.

9. වාණිජ බැංකුවක් විසින් සපයනු ලබන පහසුකම් කිහිපයක් පහත දැක්වේ.
   A - අයිරා පහසුකම් ලබා දීම
   B - තැන්පතු සඳහා පොලී ගෙවීම
   C - ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
   D - චෙක්පත් මගින් ගෙවීම් කිරීම

   ඉහත දෑ අතුරෙන්, ජංගම ගිණුම් හිමියෙකුට පමණක් ලබාගත හැකි පහසුකම් වන්නේ
   (1) A සහ C ය. (2) A සහ D ය. (3) B සහ D ය. (4) C සහ D ය.

10. සන්නිවේදන මාධ්‍ය හා ක්‍රම කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| සන්නිවේදන මාධ්‍ය | සන්නිවේදන ක්‍රම |
|---|---|
| 1. වාචික | A - ෆැක්ස් පණිවිඩය |
| 2. ලිඛිත | B - දුරකථනය |
| 3. විද්‍යුත් වාචික | C - රැස්වීම |
| 4. විද්‍යුත් ලිඛිත | D - දැන්වීම් පුවරුව |

   ඉහත සන්නිවේදන මාධ්‍ය දී ඇති අනුපිළිවෙළ අනුව, සන්නිවේදන ක්‍රම සමග නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.
   (1) A, C, B, D (2) B, A, C, D (3) C, D, A, B (4) C, D, B, A

11. රු. 5 000 000 කට රක්ෂණය කර තිබූ නුවන්ගේ මෝටර් රථය අනතුරකට භාජනය විය. නමුත් සිදු වූ අලාභය වූ රු. 800 000 පමණක් රක්ෂණ සමාගම විසින් ලබා දෙන ලදී. මේ සඳහා බලපා ඇති රක්ෂණ මූලධර්මය වන්නේ
   (1) උපරිම විශ්වාසයයි.
   (2) හානි පූරණයයි.
   (3) රක්ෂ්‍ය හිමිකමයි.
   (4) ආදේශනයයි.

12. මිහිරි තම ගෙවත්තේ වගා කරන පලතුරු, වෙළඳසැලක් පවත්වාගෙන යන කුමාරට අලෙවි කරයි. කුමාරගෙන් මිල දී ගත් පලතුරු ඉතා රසවත් බව රුවන්ගේ බිරිඳ පවසයි.
   ඉහත සිද්ධියට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) කුමාර, මිහිරිගෙන් පලතුරු මිල දී ගැනීම තොග වෙළෙඳාමකි.
   (2) රුවන්, කුමාරගෙන් පලතුරු මිල දී ගැනීම තොග වෙළෙඳාමකි.
   (3) කුමාර, රුවන්ට පලතුරු විකිණීම තොග වෙළෙඳාමකි.
   (4) මිහිරි, කුමාරට පලතුරු විකිණීම සිල්ලර වෙළෙඳාමකි.

13. ප්‍රවාහන මූලිකාංගයක් වන පර්යන්තය සඳහා නිදසුනක් වන්නේ
   (1) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ය.
   (2) ලංකා විදුලිබල මණ්ඩලය ය.
   (3) ශ්‍රී ලංකා මාර්ග සංවර්ධන අධිකාරිය ය.
   (4) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ය.

14. කළමනාකරණ කාර්යයක් වන සැලසුම්කරණය සඳහා පාසලක ක්‍රියාකාරකමක් වන්නේ
(1) වර්ෂ අවසානයේ සිසුන්ගේ ප්‍රගති වාර්තා ලබා දීම ය.
(2) ශිෂ්‍ය පැමිණීමේ නාම ලේඛනය ලකුණු කිරීම ය.
(3) අංශ ප්‍රධානීන් පත් කිරීම ය.
(4) පන්ති කාලසටහන පිළියෙල කිරීම ය.

15. ව්‍යවසායකයෙකු තම නිෂ්පාදිතය සඳහා නැවත භාවිත කළ හැකි ඇසුරුමක් නිර්මාණය කරයි. මෙම ඇසුරුම ඇතුළත් වන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය කුමක් ද?
(1) නිෂ්පාදිතය (2) මිල
(3) ස්ථානය (4) ප්‍රවර්ධනය

16. ආයෝජකයෙකුට ප්‍රාග්ධන ලාභ පමණක් ලැබිය හැක්කේ
(1) ස්වර්ණාභරණ සහ ඉඩම්වල ආයෝජනය කිරීමෙනි.
(2) ඉඩම් සහ කොටස්වල ආයෝජනය කිරීමෙනි.
(3) ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමෙනි.
(4) කොටස් සහ ඉතිරිකිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීමෙනි.

17. වැඩිවීම හර සහ අඩුවීම බැර ද්විත්ව සටහන් මූලධර්මය අදාළ වන්නේ
(1) වත්කම්වලට පමණි.
(2) වියදම්වලට පමණි.
(3) වත්කම් හා වියදම්වලට පමණි.
(4) වියදම් හා වගකීම්වලට පමණි.

18. ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනුවක් වන්නේ
(1) රු. 5 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම ය.
(2) රු. 12 000 ක ව්‍යාපාරයේ විදුලි බිල ගෙවීම ය.
(3) රු. 50 000 ක ලී බඩු අත්පිට මුදලට ගැනීම ය.
(4) ණයගැතියෙකුගෙන් රු. 14 000 ක චෙක්පතක් ලැබීම ය.

19. රාහුල් රු.7 000 කට මිල දී ගත් බඩු තොගයක් රු. 10 000 කට අත්පිට මුදලට විකුණුවේ ය. මෙම ගනුදෙනුවෙන් ඔහුගේ ව්‍යාපාරයේ මුළු වත්කම්වල වටිනාකම
(1) රු. 3 000 කින් වැඩි වේ. (2) රු. 7 000 කින් අඩු වේ.
(3) රු. 10 000 කින් වැඩි වේ. (4) වෙනස් නොවේ.

20. රයන්ගේ ව්‍යාපාරයේ 2023.03.31 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| වත්කම් (රු.) | | හිමිකම් (රු.) | | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 150 000 | = | 100 000 | + | 50 000 |

එක් ගනුදෙනුවකට පසුව ද, මෙම ගිණුම්කරණ සමීකරණයේ වටිනාකම් වෙනස් වූයේ නැත. එම ගනුදෙනුව කුමක් ද?
(1) ණයහිමියෙකුට රු. 7 500 ක් ගෙවීම
(2) ණයගැතියෙකුගෙන් රු. 10 000 ක් ලැබීම
(3) රු. 15 000 ක කොමිස් ආදායමක් ලැබීම
(4) කාර්යාලයට රු. 100 000 ක ලී බඩු ණයට ගැනීම

21. ව්‍යාපාරයක වත්කම් සහ වගකීම් යන දෙක ම අඩුවන ගනුදෙනුව කුමක් ද?
(1) අයිතිකරු රු. 10 000 ක් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් ගැනීම
(2) ණයගැතියෙකුගෙන් රු. 7 000 ක් ව්‍යාපාරයට ලැබීම
(3) ව්‍යාපාරය රු. 8 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම
(4) ව්‍යාපාරය ණයහිමියෙකුට රු. 5 000 ක් මුදලින් ගෙවීම

**22.** ව්‍යාපාරයක් කාර්යාලය සඳහා රු. 250 000 ක ලී බඩු 'මොරටු ලී බඩු' වෙතින් අත්පිට මුදලට ගනියි. මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (1) ගැනුම් ගිණුම | හර | රු. 250 000 | |
| මුදල් ගිණුම | බැර | | රු. 250 000 |
| (2) ගැනුම් ගිණුම | හර | රු. 250 000 | |
| 'මොරටු ලී බඩු' ගිණුම | බැර | | රු. 250 000 |
| (3) ලී බඩු ගිණුම | හර | රු. 250 000 | |
| මුදල් ගිණුම | බැර | | රු. 250 000 |
| (4) ලී බඩු ගිණුම | හර | රු. 250 000 | |
| 'මොරටු ලී බඩු' ගිණුම | බැර | | රු. 250 000 |

● පහත තොරතුරු ඇසුරෙන් අංක **23** සහ **24** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A - ණයට ගැනුම් රු. 20 000
B - අත්පිට විකුණුම් රු. 30 000
C - ණයහිමියෙකුට ගෙවීම් රු. 25 000
D - කාර්යාලයට පරිගණකයක් ණයට ගැනීම රු. 100 000

**23.** ගෙවීම් වවුචරය මූලාශ්‍ර ලේඛනය ලෙස භාවිත කරන ගනුදෙනුව වන්නේ

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**24.** ඉහත A, B, C හා D යන ගනුදෙනු සටහන් කිරීමට භාවිත **නොකරන** මූලික සටහන් පොත කුමක් ද?

(1) ගැනුම් ජර්නලය (2) විකුණුම් ජර්නලය
(3) මුදල් පොත (4) පොදු ජර්නලය

**25.** ද්විත්ව සටහන, මූලික සටහන් පොත් දෙකක සටහන් කරනු ලබන ගනුදෙනුව තෝරන්න.

(1) ණයගැතියෙකුගෙන් රු. 15 000 ක චෙක්පතක් ලැබීම
(2) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 3 600 ක් ලැබීම
(3) ව්‍යාපාරයට රු. 2 500 000 ක මෝටර් රථයක් අත්පිට මුදලට ගැනීම
(4) අයිතිකරුගේ පෞද්ගලික රක්ෂණ වාරිකය වූ රු. 10 000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම

**26.** රෙහාන්ගේ ව්‍යාපාරයේ 2023.03.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 500 ක් විය. 2023.04.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 4 500 ක් ලැබුණි. 2023.04.30 දින සුළු මුදල් පොතේ ශේෂය රු. 400 ක් විය. 2023.05.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා ලැබූ මුදල

(1) රු. 4 500 කි. (2) රු. 4 600 කි. (3) රු. 5 000 කි. (4) රු. 5 400 කි.

**27.** ශක්ති ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනුවකට අදාළ ලෙජරයේ තැබූ ද්විත්ව සටහන පහත දැක්වේ.

| | | |
|---|---|---|
| බැංකු ගිණුම | හර | රු. 12 000 |
| විකුණුම් ගිණුම | බැර | රු. 12 000 |

ඉහත ද්විත්ව සටහනට අදාළ ගනුදෙනුව තෝරන්න.

(1) ණයගැතියෙකුගෙන් ලද රු. 12 000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම
(2) අත්පිට විකුණුම් සඳහා ලද රු. 12 000 ක චෙක්පත සැපයුම්කරුට පැවරීම
(3) අත්පිට විකුණුම් සඳහා ලද රු. 12 000 ක චෙක්පත එම අවස්ථාවේ ම බැංකුවේ තැන්පත් කිරීම
(4) පසුගිය සතියේ විකුණුම් සඳහා ලැබූ රු. 12 000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම

**28.** සත්සර ව්‍යාපාරයේ 2023.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 12 500 ක් විය. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 9 000 කි. මෙම වෙනසට බලපෑවේ එක් ගනුදෙනුවක් පමණි. එම ගනුදෙනුව වන්නේ

(1) ණයගැතියෙකු විසින් සෘජුව ම ව්‍යාපාරයේ බැංකු ගිණුමට එවන ලද රු. 3 500 ක මුදල ය.
(2) ව්‍යාපාරයේ බැංකු ගිණුමට සෘජුව ම එවන ලද රු. 3 500 ක ලාභාංශ ආදායම ය.
(3) බැංකුවට ඉදිරිපත් නොකළ ව්‍යාපාරය විසින් ණයහිමියෙකුට නිකුත් කළ රු. 3 500 ක චෙක්පත ය.
(4) ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවන ලද රු. 3 500 ක විදුලි බිල ය.

**29.** බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසු, ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේ දී බැංකු ගිණුමට හර කරනු ලබන ගනුදෙනුව තෝරන්න.

(1) ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ විදුලි ගාස්තු රු. 2 500
(2) බැංකුව අයකරගත් චෙක්පොත් ගාස්තුව රු. 1 500
(3) ණයගැතියෙකු විසින් සෘජුව ම බැංකුවේ තැන්පත් කළ මුදල රු. 5 000
(4) බැංකුව අයකරගත් සේවා ගාස්තුව රු. 2 000

**30.** ලාභ අරමුණු කර නොගත් සංවිධාන නියමිත කාලච්ඡේදයක් තුළ සිදුකළ ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ගණනය කිරීම සඳහා පිළියෙල කරන්නේ

(1) ආදායම් හා වියදම් ගිණුම ය.
(2) ලැබීම් හා ගෙවීම් ගිණුම ය.
(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ය.
(4) වෙළෙඳ හා ලාභාලාභ ගිණුම ය.

**31.** ක්‍රීඩා සමාජයක ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් වන නමුත් ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් **නොවන** ගනුදෙනුව කුමක් ද?

(1) ක්‍රීඩා උපකරණ මිලට ගැනුම් රු. 2 500
(2) සාමාජික මුදල් ලැබීම් රු. 5 000
(3) පුවත්පත් විකුණුම් රු. 2 000
(4) ක්‍රීඩා උපකරණ ක්ෂය රු. 1 000

- පහත තොරතුරු ඇසුරෙන් අංක **32** සිට **34** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2023.01.31 දිනෙන් අවසන් මාසය තුළ ලී අල්මාරි නිෂ්පාදනය කරන ව්‍යාපාරයකට අදාළ වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| A – ලී මිල දී ගැනීම ................................................ | 280 000 |
| B – වඩු කාර්මික වැටුප ........................................... | 200 000 |
| C – වැලි කඩදාසි, පොලිෂ්, ඇණ ආදී ද්‍රව්‍ය සඳහා ..... | 15 000 |
| D – විදුලි බිල ...................................................... | 12 000 |
| E – මෝස්තර නිර්මාණ වියදම ................................ | 17 000 |
| F – යන්ත්‍ර අළුත්වැඩියා වියදම ................................ | 5 000 |

**32.** ලී අල්මාරි නිෂ්පාදනයේ ප්‍රාථමික පිරිවැය ගණනය කිරීමට අදාළ අයිතම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා B (2) A, B හා C (3) A, B හා E (4) A, B, C හා E

**33.** 2023.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලී අල්මාරි නිෂ්පාදනයට අදාළ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වන්නේ

(1) රු. 17 000 කි. (2) රු. 32 000 කි. (3) රු. 44 000 කි. (4) රු. 49 000 කි.

**34.** ලී අල්මාරි නිෂ්පාදනයේ වක්‍ර ද්‍රව්‍ය පිරිවැයට අදාළ වියදමක් වන්නේ

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

● පහත තොරතුරු ඇසුරෙන් අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2022.01.01 දින ආරම්භ කරන ලද අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය | 200 000 |
| මුදල් ශේෂය | 28 000 |
| විකුණුම් | 300 000 |
| ණයගැතියෝ | 35 000 |
| ණයහිමියෝ | 45 000 |
| ගැනුම් | 190 000 |
| ලී බඩු හා උපකරණ | 120 000 |
| 10% බැංකු ණය | 100 000 |

**අමතර තොරතුරු :**

1. වර්ෂය තුළ දී ගොඩනැගිලි කුලී ලෙස රු. 24 000 ක් මුදලින් ගෙවා ඇති අතර, මාසික ගොඩනැගිලි කුලිය රු. 2 500 කි.
2. ලී බඩු හා උපකරණ වාර්ෂිකව 5% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කෙරේ.
3. 2022.12.31 දිනට ණයගැති ශේෂයෙන් රු. 5 000 ක් බොල් ණය ලෙස කපා හැරිය යුතු ය.
4. බැංකු ණය මුදල ලබාගෙන ඇත්තේ 2022.07.01 දින ය. 2022.12.31 දින තෙක් පොලිය ගෙවා නොමැත.
5. 2022.12.31 දිනට ඉතිරි තොගය රු. 44 000 කි.

**35.** අමරගේ ව්‍යාපාරයේ දළ ලාභය නිවැරදිව ගණනය කිරීම දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 300 000 – රු. 190 000
(2) රු. 190 000 – රු. 44 000
(3) රු. 300 000 – (රු. 190 000 + රු. 44 000)
(4) රු. 300 000 – (රු. 190 000 – රු. 44 000)

**36.** අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ගොඩනැගිලි කුලී වියදම කොපමණ ද?

(1) රු. 2 500 (2) රු. 6 000 (3) රු. 24 000 (4) රු. 30 000

**37.** අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීමක් වන්නේ

(1) ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 6 000 කි.
(2) ගෙවිය යුතු බැංකු ණය පොලී රු. 10 000 කි.
(3) ගෙවූ ගොඩනැගිලි කුලී රු. 24 000 කි.
(4) බැංකු ණය රු. 100 000 කි.

**38.** අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන පරිපාලන වියදම් අයිතම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ලී බඩු ක්ෂය, ණය පොලී
(2) බොල් ණය, ගොඩනැගිලි කුලී
(3) ගොඩනැගිලි කුලී, ලී බඩු ක්ෂය
(4) බොල් ණය, ණය පොලී

**39.** අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභාලාභ ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු බැංකු ණය පොලිය වන්නේ

(1) රු. 5 000 කි. (2) රු. 10 000 කි. (3) රු. 100 000 කි. (4) රු. 105 000 කි.

**40.** 2022.12.31 දිනට අමරගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණයගැති වටිනාකම

(1) රු. 5 000 කි. (2) රු. 30 000 කි. (3) රු. 35 000 කි. (4) රු. 40 000 කි.

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம்: **60**

විෂයය / பாடம்: **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 4 | 31. | 1 |
| 02. | 2 | 12. | 1 | 22. | 3 | 32. | 3 |
| 03. | 3 | 13. | 1 | 23. | 3 | 33. | 2 |
| 04. | 4 | 14. | 4 | 24. | 2 | 34. | 3 |
| 05. | 2 | 15. | 1 | 25. | 2 | 35. | 4 |
| 06. | 4 | 16. | 1/2 | 26. | 2 | 36. | 4 |
| 07. | 2 | 17. | 3 | 27. | 3 | 37. | 1 |
| 08. | 2 | 18. | 2 | 28. | 4 | 38. | 3 |
| 09. | 2 | 19. | 1 | 29. | 3 | 39. | 1 |
| 10. | 4 | 20. | 2 | 30. | 1 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25/40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25/40

**1.** පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පොලොන්නරුවේ පදිංචි රාජා 2023.01.01 දින රු. 800 000 ක් යොදවා සහල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'හෙළ සහල්' නමින් කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදී. එදින ම 12% වාර්ෂික පොලියකට රු. 500 000 ක ණය මුදලක් ග්‍රාමීය බැංකුවෙන් ලබාගෙන රු. 900 000 ක් වටිනා වී මෝලක් සහ රු. 100 000 ක අනෙකුත් උපකරණ මිල දී ගන්නා ලදී.

ව්‍යාපාර පරිපාලන උපාධිය නිමවා පැමිණි රාජාගේ පුත් කෝසල මෙම ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සිදු කරයි. තම්බාගත් වී අව්වේ වේළීම සහ වී කෙටීම සඳහා සුපුන් බඳවා ගන්නා ලදී.
2023.01.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අත්පිට මුදලට වී මිල දී ගැනීම ............................ | 150 000 |
| අත්පිට මුදලට සහල් විකිණීම ............................ | 431 500 |
| විදුලි බිල්පත ගෙවීම ............................ | 15 000 |
| සේවක වැටුප ගෙවීම ............................ | 60 000 |
| බෙදාහැරීමේ රථ කුලී ගෙවීම ............................ | 40 000 |
| කළමනාකරුගේ වේතනය ගෙවීම ............................ | 50 000 |
| දහයියා විකිණීම ............................ | 50 000 |

**අමතර තොරතුරු:**

- වී මෝල වාර්ෂිකව 12% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.
- 2023.01.31 දිනට ඉතිරි සහල් හෝ වී තොග නොමැත.
- බැංකු ණය මුදල සඳහා 2023.01.31 දිනට පොලිය ගෙවා නොමැත.
- මාසික ගොඩනැගිලි කුලී රු. 10 000, 2023.01.31 දින තෙක් ගෙවා නොමැත.

පසුගිය කන්නයේ පැවති දැඩි නියඟය නිසා වී නිෂ්පාදනය අඩු වීමත් සමඟ සහල් නිෂ්පාදකයින් අතර දැඩි තරඟකාරීත්වයක් පැවතුණි. රජය වී මිල දී ගැනීම සඳහා පාලන මිලක් ද නියම කරන ලදී. මේ නිසා 'හෙළ සහල්' ව්‍යාපාරය සහල් කිලෝග්‍රෑමයක විකුණුම් මිල රුපියලකින් අඩු කිරීමට තීරණය කර ඇත.

(i) (අ) 'හෙළ සහල්' ව්‍යාපාරය සපුරාලනු ලබන මිනිස් වුවමනාව කුමක් ද?
(ආ) 'හෙළ සහල්' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව **දෙකක්** නිදසුන් සහිතව සඳහන් කරන්න.

(ii) 'හෙළ සහල්' ව්‍යාපාරයේ නිෂ්පාදන සාධක වන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වය සඳහා නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න.

(iii) (අ) 'හෙළ සහල්' ව්‍යාපාරයේ ශක්තියක් සහ තර්ජනයක් සඳහන් කරන්න.
(ආ) සිද්ධියේ ඇතුළත් 'හෙළ සහල්' ව්‍යාපාරයේ ආර්ථික පරිසර සාධකයක් සඳහා නිදසුනක් ලියන්න.

(iv) 'හෙළ සහල්' ව්‍යාපාරයේ පහත එක් එක් දෑ සඳහා නිදසුන බැගින් ලියන්න.
(අ) අලෙවිකරණ මිශ්‍රයේ නිෂ්පාදිතය
(ආ) කළමනාකරණ කාර්යයක් වන සැලසුම්කරණය

(v) බැංකු ණය මුදල ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන වටිනාකම් සහිතව ලියන්න.

(vi) (අ) 'හෙළ සහල්' ව්‍යාපාරය භාවිත කරන මූලාශ්‍ර ලේඛන **දෙකක්** ලියන්න.
(ආ) 'හෙළ සහල්' ව්‍යාපාරයේ නිෂ්පාදන පිරිවැය තුළ ඇතුළත් සෘජු පිරිවැයක් සහ වක්‍ර පිරිවැයක් වටිනාකම් සහිතව ලියන්න.

(vii) 2023.01.31 දිනට 'හෙළ සහල්' ව්‍යාපාරයේ අත ඉතිරි මුදල ගණනය කරන්න.

(viii) 'හෙළ සහල්' ව්‍යාපාරයේ 2023.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(ix) 2023.01.31 දිනට 'හෙළ සහල්' ව්‍යාපාරයේ ජංගම වගකීම් **දෙකක්** වටිනාකම් සහිතව සඳහන් කරන්න.

(x) 2023.01.31 දිනට 'හෙළ සහල්' ව්‍යාපාරයේ මුළු වත්කම් හා හිමිකම් ගණනය කරන්න.

**(ලකුණු 02 × 10 = 20 යි)**

1. (i) (අ) සහල් /

(ලකුණු 01 යි)

(ආ)
- අයිතිකරු - රාජා
- මූල්‍ය ආයතනය - ග්‍රාමීය බැංකුව
- කළමනාකරු - කෝසල / රාජාගේ පුතා
- සේවකයා - සුපුන්
- සැපයුම්කරුවෝ - වී සපයන්නන්
- පාරිභෝගිකයෝ - සහල් සහ දහයියා මිලදීගන්නන්
- රජය - රජය
- තරඟකරුවෝ - සහල් නිෂ්පාදකයින් /

(½ × 2 - ලකුණු 01 යි)

(ii)
- භූමිය - හිරු එළිය / අව්ව / සුළඟ /
- ශ්‍රමය - කෝසල / සුපුන්
- ප්‍රාග්ධනය - මුදල් / වී මෝල / වී තොගය / සහල් තොගය / දහයියා තොගය / අනෙකුත් උපකරණ
- ව්‍යවසායකත්වය - රාජාගේ ව්‍යවසායකත්ව හැකියාව /

(½ × 4 = ලකුණු 02 යි)

(iii) (අ) **ශක්තිය**

- රාජාගේ මූල්‍ය ශක්තිය
- ව්‍යාපාර පරිපාලන උපාධියක් සහිත කළමණාකරු / කෝසල /

(½ × 1 - ලකුණු ½ යි)

**තර්ජනය**

- නියගයක් පැවතීම
- සහල් නිෂ්පාදකයින් අතර දැඩි තරඟයක් පැවතීම
- වී මිලදී ගැනීම සඳහා පාලන මිලක් රජය විසින් නියම කිරීම /

(½ × 1 = ලකුණු ½ යි)

(ආ)
- ණය සඳහා පොළී අනුපාතය 12%
- සහල්වල විකුණුම් මිල රුපියලකින් අඩු කිරීම /
- රජය පාලන මිලක් නියම කිරීම /

(01 × 1 - ලකුණු 01 යි)

(iv) (අ) සහල්, හෙළ සහල්, දහයියා

*(ලකුණු 01 යි)*

(ආ) සහල් මිල රුපියලකින් අඩු කිරීමට තීරණය කිරීම

*(ලකුණු 01 යි)*

(v) මුදල් ගිණුම / මුදල් පොත හර රු. 500 000

බැංකු ණය ගිණුම / ග්‍රාමීය බැංකු ණය ගිණුම බැර රු. 500 000

*(ලකුණු 02 යි )*

(vi) (අ)
- ලදුපත
- ගෙවීම් වවුචරය
- ජර්නල් වවුචරය

*(½ × 2 = ලකුණු 01 යි )*

(ආ) **සෘජු පිරිවැය**
- වී මිලදී ගැනීම රු. 150 000
- සේවක / සුපුත්ගේ වැටුප ගෙවීම රු. 60 000

*(½ × 1 = ලකුණු ½ යි )*

**වක්‍ර පිරිවැය**
- විදුලි බිල්පත් ගාස්තු රු. 15 000
- කළමණාකරු වේතන රු. 50 000
- වී මෝලේ ක්ෂය රු. 9 000
- ගොඩනැගිලි කුලි රු. 10 000

*(½ × 1 = ලකුණු ½ යි )*

(vii) මුදල් ශේෂය - රු. 466 500 *(ලකුණු 02 යි)*

**පෙරවැඩ**

**මුදල් පොත**

| දිනය | ල. අ | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | ව. අ | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2023. 01.01 | | ප්‍රාග්ධනය | | 800 000 | 2023. 01.01 | | වී මෝල | | 900 000 |
| | | බැංකු ණය | | 500 000 | | | අනෙකුත් උපකරණ | | 100 000 |
| | | විකුණුම් | | 431 500 | | | ගැණුම් | | 150 000 |
| | | දහයියා විකුණුම් | | 50 000 | | | විදුලි වියදම් | | 15 000 |
| | | | | | | | සේවක වැටුප් | | 60 000 |
| | | | | | | | බෙදා හැරීමේ රථ කුලී | | 40 000 |
| | | | | | | | කළමණාකරු වේතන | | 50 000 |
| | | | | | 01.31 | | ශේෂය ප/ගෙ | | 466 500 |
| | | | | 1 781 500 | | | | | 1 781 500 |
| 02.01 | | ඉ/ගෙ ශේෂය | | 466 500 | | | | | |

*(ඕනෑම තිවැරදි අයිතම 03 කට ½ බැගින් ලකුණු 1 ½ යි)*

ඕනෑම පවතන ලියා ඇත්නම් ලකුණු දෙන්න. දිනට 3 කට 1/2

(viii) ශුද්ධ ලාභය - රු. 142 500 *(ලකුණු 02 යි)*

**පෙරවැඩ**

**ශුද්ධ ලාභය ගණනය කිරීමේ ලේඛනය**

| | (රු.) | (රු.) |
|---|---|---|
| **ආදායම්** | | |
| සහල් විකුණුම් | 431 500 | |
| දහයියා විකුණුම් | 50 000 | (½) |
| | | **481 500** |
| **වියදම්** | | |
| වී ගැණුම් | 150 000* | |
| විදුලි ගාස්තු | 15 000* | |
| සේවක වැටුප් | 60 000* | |
| බෙදා හැරීමේ රථ කුලි | 40 000* | |
| කළමනාකරු වේතන | 50 000* | |
| වී මෝලේ ක්ෂය | 9 000* | |
| බැංකු ණය පොලිය | 5 000* | |
| ගොඩනැගිලි කුලිය | 10 000* | **339 000** |
| | | |
| **ශුද්ධ ලාභය** | | **142 500** |

**(* අයිතම 4ක් සඳහා ලකුණු ½ යි)**

(ix)
- උපචිත බැංකු ණය පොලී රු. 5 000
- උපචිත ගොඩනැගිලි කුලී රු. 10 000

*(01× 2 = ලකුණු 02 යි )*

(x) **මුළු වත්කම්** රු. 1 457 500 *(ලකුණු 01 යි)*

පෙරවැඩ
- වී මෝල - රු. 891 000 (900 000 - 9 000) (½)
- මුදල් (½) - රු. 466 500
- අනෙකුත් උපකරණ - රු. 100 000

**මුළු වත්කම්** - රු. 1 457 500

**හිමිකම** රු. 942 500 ***(ලකුණු 01 යි)***

**පෙරවැඩ**

- ආරම්භක ප්‍රාග්ධනය - රු. 800 000
- ශුද්ධ ලාභය - රු. 142 500 (01)

**හිමිකම** - **රු. 942 500**

හෝ

**පෙරවැඩ**

- මුළු හිමිකම = මුළු වත්කම් - මුළු වගකීම්

(½) = 1 457 500 - 515 000 (½)

= 942 500

හෝ

**පෙරවැඩ**

- මුළු හිමිකම = ආරම්භක ප්‍රාග්ධනය + (ආදායම් - වියදම්)

= 800 000 + (481 500 - 339 000) (01)

= 942 500

| | (i) | | (ii) | (iii) | | (iv) | | (v) | (vi) | | (vii) | (viii) | (ix) | (x) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (අ) | (ආ) | | (අ) | (ආ) | (අ) | (ආ) | | (අ) | (ආ) | | | | | |
| 01 | 01 | 01 | 02 | 01 | 01 | 01 | 01 | 02 | 01 | 01 | 02 | 02 | 02 | 02 | 20/20 |

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

2. (i) ඒක පුද්ගල ව්‍යාපාරයක, ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක් සැම විට ම මිනිස් අවශ්‍යතාවක් හා වුවමනාවක් සපුරාලයි.

(ආ) ව්‍යාපාරයක් සැම විට ම ලාභ ලැබීමේ අරමුණින් ආරම්භ කරනු ලැබේ.

(ඉ) ව්‍යාපාරයක ඇල්මැති පාර්ශ්ව සැම විට ම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් වේ.

(ඊ) සංස්ථාපිත සමාගමක ආයෝජකයෙකුගේ වගකීම, ආයෝජිත මුදලේ වටිනාකමට සීමා වේ. (ලකුණු 02 යි)

(iii) සීමාසහිත 'ලක් තේ' පෞද්ගලික සමාගම, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සහ ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව ඌව පළාතේ ජනතාවට නළ ළිං 50 ක් ස්ථාපනය කර දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

(අ) ව්‍යාපෘතිය මගින් සපුරාලන මිනිස් අවශ්‍යතාව හා වුවමනාව පිළිවෙළින් ලියන්න.

(ආ) සිද්ධියේ ඇතුළත් ව්‍යාපාර සංවිධාන **දෙකක්** සඳහන් කර, ඒවා අයිතිය අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 02 යි)

(iv) ව්‍යාපාර දෙකක් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග දෙකක් පහත දැක්වේ.

**A** – ෆාස්ට් කෑෂ් (Fast cash) මූල්‍ය සමාගම ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශවලට අනුව තම තැන්පතු සඳහා වාර්ෂික පොලිය 15% සිට 20% දක්වා ඉහළ දැමීම

**B** – 'අමරස' කජු නිෂ්පාදකයෝ, අන්තර්ජාලයෙන් ඇණවුම් කරන ගනුදෙනුකරුවන් සඳහා නව පරිගණක මෘදුකාංගයක්, එන්ඩ් සොෆ්ට්වෙයා (End Software) පෞද්ගලික සමාගමෙන් (ලබා) ගැනීම

(අ) ඉහත **A** හා **B** ක්‍රියාමාර්ගවලට අදාළ පරිසර සාධක නම් කරන්න.

(ආ) ඉහත **A** හා **B** හි ඇතුළත්

1. සේවා සපයන ව්‍යාපාරයක් සඳහන් කරන්න.
2. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**2.** (i)

- ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම
- ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම
- රජයෙන් ලබාදෙන දිරි ගැන්වීම් ලබා ගැනීමට සුදුසුකමක් වීම
- ණය ලබා ගැනීමේ දී පහසුවක් වීම
- දිරි ගැනීම / කීර්තිනාමය / අභිප්‍රාය

1 × 2 ල (3)

***(01 × 2 - ලකුණු 02 යි)***

(ii)
(අ) සත්‍යයි ✓
(ආ) අසත්‍යයි ×
(ඉ) අසත්‍යයි ×
(ඊ) සත්‍යයි ✓

**(½ × 4 - ලකුණු 02 යි)**

(iii) (අ) අවශ්‍යතාව - ආහාර

උවමනාව - ජලය / නළ ළිං

(½ × 2 = ලකුණු 01 යි)

(ආ)
- සීමාසහිත ලක් තේ පෞද්ගලික සමාගම / සංස්ථාපිත සමාගම් - පෞද්ගලික අංශය
- ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය / රාජ්‍ය සංස්ථා - පොදු අංශය / රාජ්‍ය අංශය
- ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව / රාජ්‍ය දෙපාර්තමේන්තු - පොදු අංශය / රාජ්‍ය අංශය

(½ × 2 = ලකුණු 01 යි)

(iv) (අ) A - ආර්ථික පරිසරය
B - තාක්ෂණික පරිසරය / ගෝලීය පරිසරය

(½ × 2 = ලකුණු 01 යි)

(ආ) 1. ෆාස්ට් කෑෂ් මූල්‍ය සමාගම/ ශ්‍රී ලංකා මහ බැංකුව/
End Software පෞද්ගලික සමාගම

(½ × 1 = ලකුණු ½ යි)

2. අමරස කජු නිෂ්පාදකයෝ

(ලකුණු ½ යි)

| 02 | (i) | (ii) | | | | (iii) | | (iv) | | 08/08 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අ | ආ | ඉ | ඊ | අ | ආ | අ | ආ | |
| | 02 | ½ | ½ | ½ | ½ | 01 | 01 | 01 | 01 | |

www.e-kalvi.com

**3.** (i) ප්‍රවාහන මූලිකාංග නම් කරන්න.

(ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩයක් හෝ සේවාවක් විකිණීම සිල්ලර වෙළෙඳාම වේ.


(ආ) සන්නිවේදන ක්‍රියාවලියක පණිවුඩය ලබන්නා, පණිවුඩය සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය, ප්‍රතිපෝෂණයයි.

(ඉ) ණයපතක් ලබා ගැනීම සඳහා පුද්ගලයෙකුට බැංකුවක ගිණුමක් තිබිය යුතු වේ.

(ඊ) ජීවිතයක් හෝ දේපළක් රක්ෂණය කිරීමට යම් පාර්ශ්වයකට ඇති නීත්‍යානුකූල අයිතිය, රක්ෂ්‍ය හිමිකම වේ.

(ලකුණු 02 යි)

(iii) පහත දැක්වෙන්නේ (A) සිට (F) දක්වා අක්ෂර යෙදූ චෙක්පතක ආකෘතියකි.




පහත වගුවේ දැක්වෙන චෙක්පතක මූලිකාංගවලට, අදාළ අක්ෂරය ඉහත චෙක්පත ඇසුරෙන් ලියන්න.
(පළමු මූලිකාංගයට අදාළ අක්ෂරය දී ඇත.)

| චෙක්පතක මූලිකාංග | අක්ෂරය |
|---|---|
| 1. චෙක්පතෙහි දිනය | C |
| 2. අණකරුගේ අත්සන | |
| 3. අණලදු | |
| 4. ආදායකයාගේ නම | |
| 5. වටිනාකම ඉලක්කමෙන් | |

(ලකුණු 02 යි)

(iv) යමුනා 'ව්‍යාපාර ඉලක්ක' නමැති වැඩමුළුවට සහභාගි වී එන අතරතුර ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට ගොස් තම මෝටර් රථයේ රක්ෂණ වාරිකය ගෙව්වා ය. තව ද තම ජංගම දුරකථනයෙන් නෙට් කොම් (Net com) පෞද්ගලික සමාගම අමතා තම ව්‍යාපාර වෙබ් පිටුවේ නිර්මාණ කටයුතු ගැන විමසී ය.

(අ) ඉහත සිද්ධියේ සඳහන් රක්ෂණයට අදාළ පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය පිළිවෙළින් නම් කරන්න.

(ආ) ඉහත සිද්ධියේ සඳහන් සන්නිවේදන ක්‍රමයක් සහ එයට අදාළ සන්නිවේදන මාධ්‍යය පිළිවෙළින් ලියන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**3.**

(i)

- මාර්ගය
- මාධ්‍යය
- බලය
- පර්යන්තය / [illegible]

*( ½ × 4 = ලකුණු 02 යි)*

(ii) (අ) සත්‍යයි ✓
(ආ) අසත්‍යයි ✗
(ඉ) අසත්‍යයි ✗
(ඊ) සත්‍යයි ✓

(½ × 4 = ලකුණු 02 යි)

(iii)

| චෙක්පතක මූලිකාංග | අක්ෂරය |
|---|---|
| 2. අණකරුගේ අත්සන | F |
| 3. අණලද්දා | A |
| 4. ආදායකයාගේ නම | B |
| 5. වටිනාකම ඉලක්කමෙන් | E |

(½ × 4 = ලකුණු 02 යි)

(iv) (අ) පළමු පාර්ශ්වය - යමුනා
දෙවන පාර්ශ්වය - ශ්‍රී ලංකා රක්ෂණ සමාගම

(½ × 2 = ලකුණු 01 යි)

(ආ) **සන්නිවේදන ක්‍රමය** **සන්නිවේදන මාධ්‍යය**

- ජංගම දූරකථනය - විද්‍යුත් වාචික
- වැඩමුළුව - වාචික

(½ × 02 = ලකුණු 01 යි)

| 03 | (i) | (ii) | | | | (iii) | (iv) | | 08/08 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අ | ආ | ඉ | ඊ | | අ | ආ | |
| | 02 | ½ | ½ | ½ | ½ | 02 | 01 | 01 | |

www.e-kalvi.com

**4.** (i) **කළමනාකරණ කාර්යයන් නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) **පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද** යන්න දක්වන්න.

(අ) **දේපළවල ආයෝජනයෙන් ලැබිය හැක්කේ ප්‍රාග්ධන ලාභ පමණි.**

(ආ) **ආයෝජනයක අවදානම හා ප්‍රතිලාභය අතර සෘණ සම්බන්ධතාවක් පවතී.**

(ඉ) **අලෙවිකරණ මිශ්‍රයේ** ව්‍යාපාරය සඳහා ආදායම් ලබාදෙන එක ම විචල්‍යය මිල වේ.

(ඊ) **සීමිත සම්පත්වලින්** උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ව්‍යාපාරයකට කළමනාකරණය අවශ්‍ය වේ.

(ලකුණු 02 යි)

(iii) **ස්වර්ණාභරණ නිෂ්පාදන** ව්‍යාපාරයක් මාර්ගගත ක්‍රමයට නව මෝස්තර ලබා ගැනීමටත් අලෙවිය වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රචාරණ වියදම් වැඩි කිරීමටත්, තීරණය කරන ලදී.

(අ) ඉහත සිද්ධියේ ඇතුළත් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය **දෙකක්** ලියන්න.

(ආ) ඉහත (අ) හි ඔබ සඳහන් කළ විචල්‍යවලට අදාළ නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න.

(ලකුණු 02 යි)

(iv) රුවන් ප්‍රාග්ධන ලාභ ද, සපුමල් පොලී ආදායම් ද ඔවුන්ගේ ඉතිරිකිරීම් ආයෝජනය කිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂා කරති.

(අ) රුවන් තෝරාගත යුතු ආයෝජන මාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(ආ) සපුමල් තෝරාගත යුතු ආයෝජන මාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**4.**

(i)

- සැලසුම්කරණය
- සංවිධානකරණය
- මෙහෙයවීම
- පාලනය

*(½ × 4 = ලකුණු 02 යි)*

(ii)

(අ) අසත්‍යයි

(ආ) අසත්‍යයි

(ඉ) සත්‍යයි

(ඊ) සත්‍යයි

*(½ × 4 = ලකුණු 02 යි)*

(iii) (අ) නිෂ්පාදිතය, ප්‍රවර්ධනය, ස්ථානය

*(½ × 2 = ලකුණු 01 යි)*

(ආ) නිෂ්පාදිතය - ස්වර්ණාභරණ, නව මෝස්තර

ප්‍රවර්ධනය - ප්‍රචාරණ වියදම් වැඩි කිරීම

ස්ථානය - මාර්ගගත ක්‍රමය

*(½ × 2 = ලකුණු 01 යි)*


www.e-kalvi.com

(iv) (අ)
- දේපල මිලදී ගැනීම (ඉඩම් / රථ වාහන / ස්වර්ණාභරණ/ගොඩනැගිලි)
- කොටස්වල ආයෝජනය කිරීම
- [illegible]
- [illegible]
- [illegible]

(½ × 2 = ලකුණු 01 යි)

(ආ)
- ඉතිරි කිරීම් ගිණුම්වල ආයෝජනය
- ස්ථාවර තැන්පතු ගිණුම්වල ආයෝජනය / [illegible]
- භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය

(½ × 2 = ලකුණු 01 යි)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 04 | (i) | (ii) | | | | (iii) | | (iv) | | 08/08 |
| | | අ | ආ | ඉ | ඊ | අ | ආ | අ | ආ | |
| | 02 | ½ | ½ | ½ | ½ | 01 | 01 | 01 | 01 | |

## II කොටස - ගිණුම්කරණය

5. (i) වගකීමක ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් වත්කම්, ජංගම වත්කමක් ද, ජංගම නොවන වත්කමක් ද, යන්න සඳහන් කරන්න.

(අ) විකිණීම සඳහා මිල දී ගත් භාණ්ඩ තොගය

(ආ) කාර්යාලයීය ලී බඩු

(ඉ) යන්ත්‍ර හා උපකරණ

(ඊ) ලැබිය යුතු ගෙවල් කුලී (ලකුණු 02 යි)

(iii) 2023.01.01 දිනට නදුන්ගේ ව්‍යාපාරයේ මුළු වත්කම් රු. 200 000 ක් ද මුළු වගකීම් රු. 50 000 ක් ද විය. මෙම ව්‍යාපාරයේ 2023.01.01 දින සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

(අ) රු. 10 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම

(ආ) ණයහිමියෙකුට රු. 5 000 ක් ගෙවීම

(ඉ) ණයගැතියෙකුගෙන් රු. 15 000 ක් ලැබීම

(ඊ) රු. 5 000 ක ලිපිද්‍රව්‍ය වියදම් ගෙවීම

(උ) පිරිවැය රු. 10 000 ක් වූ භාණ්ඩ තොගය රු. 15 000 කට ණයට විකිණීම

**අවශ්‍ය වන්නේ :**

(අ) ඉහත ගනුදෙනු 2023.01.01 දිනට නදුන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම (පිළිතුරු සැපයීම සඳහා පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු ගනුදෙනුවෙහි බලපෑම දී ඇත.)

| ගනුදෙනුව | වත්කම් (රු.) = | හිමිකම (රු.) + | වගකීම් (රු.) |
|---|---|---|---|
| (අ) | + 10 000 (භාණ්ඩ තොගය) | – | + 10 000 (ණයහිමියෝ) |
| (ආ) | | | |
| (ඉ) | | | |
| (ඊ) | | | |
| (උ) | | | |

(ආ) ඉහත ගනුදෙනුවලින් පසු 2023.01.01 දිනට නදුන්ගේ ව්‍යාපාරයේ වටිනාකම් සහිත ගිණුම්කරණ සමීකරණය (ලකුණු 04 යි)

(iv) ශාන්ගේ ව්‍යාපාරයේ ණයට ගැනුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2023.01.03 | 65 | පුබුදු | 25 000 |
| 2023.01.10 | 123 | අසංක | 18 000 |
| 2023.01.25 | 135 | සමන් | 12 000 |

**අවශ්‍ය වන්නේ :**

(අ) ඉහත ගනුදෙනු ශාන්ගේ ව්‍යාපාරයේ ගැනුම් ජර්නලයේ සටහන් කිරීම

(ආ) 2023.01.31 දිනට ගැනුම් ජර්නලයේ ගනුදෙනු අදාළ ලෙජර් ගිණුම්වල සටහන් කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**


www.e-kalvi.com

**5.**

(i)

- අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම
- නිරවුල් කිරීමේදී ව්‍යාපාරයේ ආර්ථික සම්පත් පිටතට ගලායාම
- වර්තමාන බැඳීමක් තිබීම

*(01× 2 = ලකුණු 02 යි)*

(ii) (අ) - ජංගම වත්කමකි

(ආ) - ජංගම නොවන වත්කමකි

(ඉ) - ජංගම නොවන වත්කමකි

(ඊ) - ජංගම වත්කමකි

*(½ × 4 = ලකුණු 02 යි)*

(iii)

| ගනුදෙනුව | වත්කම් | = හිමිකම | + වගකීම් | |
|---|---|---|---|---|
| (ආ) | - 5 000 (මුදල්) | - | - 5 000 (ණයහිමියෝ) | (½) |
| (ඉ) | + 15 000 (මුදල්)<br>- 15 000 (ණයගැතියෝ) | - | - | (½) |
| (ඊ) | - 5 000 (මුදල්) | - 5 000(ලිපිද්‍රව්‍ය වියදම්) | - | (½) |
| (උ) | -10 000 (භාණ්ඩ තොගය)<br>+ 15 000 (ණයගැතියෝ) | + 5 000 (ලාභය ) | - | (01) |

*(ලකුණු 02 ½ යි)*

(ආ)

| වත්කම් | = හිමිකම් | + වගකීම් |
|---|---|---|
| රු. 205 000 | රු. 150 000 | රු. 55 000 |
| (½) | (½) | (½) |

*(ලකුණු 01 ½ යි)*



www.e-kalvi.com

(iv) (අ)

### ශාන් ව්‍යාපාරයේ **ගැනුම් ජර්නලය**

| දිනය | ඉ.අ. | සැපයුම්කරු | වට්ටම් රු. | ලෙ.පි. | |
|---|---|---|---|---|---|
| 23.01.03 | 65 | පුබුදු | 25 000 | | (½) |
| 23.01.10 | 123 | අසංක | 18 000 | | (½) |
| 23.01.25 | 135 | සමන් | 12 000 | | (½) |
| 23.01.31 | | ගැනුම් ගිණුමට හර කළා | 55 000 | | (½) |

* [illegible] ½ [illegible] **(ලකුණු 02 යි)**

(ආ)

### ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | මුදල රු. | දිනය | විස්තරය | ස.පි. | මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 23.01.31 | ණයහිමියෝ | | (½) 55 000 | | | | |

### පුබුදුගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | මුදල රු. | දිනය | විස්තරය | ස.පි. | මුදල රු. | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 23.01.03 | ගැනුම් ගිණුම | | 25 000 | (½) |

### අංසකගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | මුදල රු. | දිනය | විස්තරය | ස.පි. | මුදල රු. | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 23.01.10 | ගැනුම් ගිණුම | | 18 000 | (½) |

### සමන්ගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | මුදල රු. | දිනය | විස්තරය | ස.පි. | මුදල රු. | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 23.01.25 | ගැනුම් ගිණුම | | 12 000 | (½) |

**(ලකුණු 02 යි)**

| | (i) | (ii) | | | | (iii) | | (iv) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | (ආ) | (ඉ) | (ඊ) | (උ) | අ | ආ | අ | ආ | |
| 05 | 02 | 1/2 | 1/2 | 1/2 | 1/2 | 2 1/2 | 1 1/2 | 2 | 2 | 12/12 |


www.e-kalvi.com

6. (i) පහත එක් එක් වියදමට අදාළ නිෂ්පාදන පිරිවැය මූලිකාංගය ලියන්න.

(අ) ඇඟලුම් නිෂ්පාදන ආයතනයක මෝස්තර නිර්මාණකරුට ගෙවීම

(ආ) ගඩොල් නිෂ්පාදන ආයතනයක මැටි මිශ්‍ර කිරීම සඳහා යොදන ජලය සඳහා ගෙවීම (ලකුණු 02 යි)

(ii) වාණිජ බැංකු විසින් තම ජංගම ගිණුම් හිමියන්ට යවන බැංකු ප්‍රකාශනයක ඇතුළත් අයිතම හතරක් ලියන්න. (ලකුණු 02 යි)

(iii) 'සංහිඳ' පොත් මුද්‍රණ ආයතනයට 2023 ජනවාරි මාසයේ දී ළමා පොත් පිටපත් 1000 ක් මුද්‍රණය සඳහා ඇණවුමක් ලැබුණි. 2023.01.31 දින ඇණවුමට අනුව නිෂ්පාදනය අවසන් කළ අතර ඒ සඳහා ගෙවූ වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| මුද්‍රණ කඩදාසි | 80 000 |
| නිෂ්පාදන සුපරීක්ෂක වැටුප | 40 000 |
| මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු වැටුප | 60 000 |
| ගම්, නූල්, තීන්ත හා වෙනත් ද්‍රව්‍ය | 5 000 |
| මුද්‍රණ අංශයේ විදුලි බිල | 15 000 |
| මුද්‍රණ අංශයේ මුරකරු වැටුප | 28 000 |
| පොතකට ගෙවූ පුරස්කාරය | 20 |
| මුද්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා වියදම් | 3 000 |
| නව මුද්‍රණ යන්ත්‍රයක් මිලට ගැනීම | 150 000 |

- 2023.01.31 දිනට ඉතිරි ද්‍රව්‍ය කිසිවක් නොමැත.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2023 ජනවාරි මාසය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළියෙල කිරීම

(ආ) ළමා පොතක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම (ලකුණු 04 යි)

(iv) සේමිනිගේ ව්‍යාපාරයේ 2023.03.31 දිනට බැංකු ගිණුමේ තිබූ වාසිදායක ශේෂය රු. 38 000 කි. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 21 000 කි. මෙම ශේෂ වෙනස්වීමට බලපෑ හේතු පහත දැක්වේ.

1. මාර්තු මාසය තුළ බැංකුවේ තැන්පත් කළ රු. 14 000 ක චෙක්පත උපලබ්ධි වී නොතිබීම
2. ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවූ බැංකු ණය වාරිකය රු. 45 000 කි
3. මාර්තු මාසයේ දී ණයහිමියෙකුට නිකුත් කළ රු. 15 000 ක චෙක්පත බැංකුවට ඉදිරිපත් කර නොතිබීම
4. ණයගැතියෙකු විසින් සෘජුව ම ව්‍යාපාරයේ බැංකු ගිණුමේ රු. 27 000 ක් තැන්පත් කිරීම

**අවශ්‍ය වන්නේ :**

(අ) 2023.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2023.03.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**6.**

(i) (අ) සෘජු වෙනත් වියදම්

(ආ) වක්‍ර ද්‍රව්‍ය පිරිවැය *(01× 2 = ලකුණු 02 යි)*

(ii)
- මාසය ආරම්භයේ ශේෂය
- මාසය තුළ මුදල් තැන්පතු
- මාසය තුළ චෙක් තැන්පතු
- චෙක්පත්වලට ගෙවීම්
- සෘජු ප්‍රේෂණ ලැබීම්
- බැංකුව අයකළ ගාස්තු
  (බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු, අයිරා පොලී)
- ස්ථාවර නියෝග මත ගෙවීම්
- මාසය අවසානයේ ශේෂය *(½ × 4 = ලකුණු 02 යි)*

(iii) (අ)

## නිෂ්පාදන පිරිවැය ලේඛනය

| පිරිවැය අයිතමය | රු. | රු. |
|---|---|---|
| **ප්‍රාථමික පිරිවැය** | | |
| සෘජු ද්‍රව්‍ය - මුද්‍රණ කඩදාසි | 80 000 | |
| සෘජු ශ්‍රමය - මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු වැටුප | 60 000 | |
| සෘජු වෙනත් වියදම් - පුරස්කාර වියදම් | 20 000 (½) | |
| ප්‍රාථමික පිරිවැය | | (½) 160 000 |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | |
| වක්‍ර ද්‍රව්‍ය - ගම්, නූල්, තීන්ත | 5 000* | |
| වක්‍ර ශ්‍රමය - නිෂ්පාදන සුපරීක්ෂක වැටුප | 40 000* | |
| මුද්‍රණ අංශයේ මුරකරු වැටුප | 28 000* | |
| වක්‍ර වෙනත් වියදම් - මුද්‍රණ අංශයේ විදුලිබිල | 15 000* | |
| මුද්‍රණ අංශයේ අලුත්වැඩියාව | 3 000* | |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | 91 000 |
| **මුළු නිෂ්පාදන පිරිවැය** (½) | | 251 000 (½) |

* අයිතම 3 හෝ 4 සඳහා ලකුණු ½ යි

* අයිතම 5 ක් සඳහා ලකුණු *01* යි

(ආ) ළමා පොතක නිෂ්පාදන පිරිවැය = රු. 251 (01)

**පෙරවැඩ**

(½) $\frac{251\,000}{1000}$ (½)

*(ලකුණු 04 යි)*

www.e-kalvi.com

(iv)

(අ)

**බැංකු ගිණුම**

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 23.03.31 | ශේෂය ඉ/ගෙ | | 38 000 | (½) | | ණය වාරිකය | | 45 000 | (½) |
| | ණයගැති ප්‍රේෂණ | | 27 000 | (½) | 23.03.31 | ශේෂය ප/ගෙ | | 20 000 | (½) |
| | | | 65 000 | | | | | 65 000 | |
| 23.04.01 | ශේෂය ඉ/ගෙ | | 20 000 | | | | | | |

**(ලකුණු 02 යි)**

(ආ)

**2023 මාර්තු 31 දිනට**

**බැංකු සැසඳුම් විස්තරය**

| | රු. | රු. | |
|---|---|---|---|
| බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය | | (½) 20 000 | |
| එකතු කළා :- | | | |
| නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත් | 15 000 | 15 000 | (½) |
| | | 35 000 | |
| අඩු කළා :- | | | |
| තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් | 14 000 | (14 000) | (½) |
| 2023.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය (½) | | 21 000 | |

**(ලකුණු 02 යි)**

| 06 | (i) | | (ii) | (iii) | | (iv) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අ | ආ | | අ | ආ | අ | ආ | 12/12 |
| | 01 | 01 | 02 | 03 | 01 | 02 | 02 | |

7. (i) ලාභ අරමුණු කර නොගත් සංවිධාන විසින් පිළියෙල කරනු ලබන ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් හා වියදම් ගිණුම අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) එක්සත් ළමා සමාජයේ මුළු සාමාජිකයින් සංඛ්‍යාව 250 කි. එක් සාමාජිකයෙකුගේ මාසික සාමාජික මුදල රු. 50 කි. 2022 වර්ෂයේ දී සාමාජිකයින් 20 ක් හැර සෙසු සාමාජිකයින් වාර්ෂික සාමාජික ගාස්තු ගෙවා ඇත.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2022 වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කරන සාමාජික මුදල් වටිනාකම

(ආ) 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුමේ සටහන් කරන සාමාජික මුදල් වටිනාකම (ලකුණු 02 යි)

(iii) සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සොනාලිගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ගැනුම් | 360 000 | |
| විකුණුම් | | 538 000 |
| ලී බඩු හා උපකරණ | 180 000 | |
| 2022.01.01 දිනට තොගය | 80 000 | |
| 8% බැංකු ණය | | 100 000 |
| විදුලි ගාස්තු | 12 000 | |
| ගෙනල්මේ කුලී | 18 000 | |
| බෙදාහැරීමේ වියදම් | 6 000 | |
| ගොඩනැගිලි කුලී | 20 000 | |
| බැංකු ගාස්තු | 2 200 | |
| ණයගැතියෝ | 70 000 | |
| ණයහිමියෝ | | 50 000 |
| මුදල් ශේෂය | 45 000 | |
| බැංකු අයිරාව | | 12 000 |
| ගෙවූ අයිරා පොලී | 500 | |
| ප්‍රචාරණ වියදම් | 6 300 | |
| යන්ත්‍ර | 200 000 | |
| ප්‍රාග්ධනය | | 300 000 |
| | 1 000 000 | 1 000 000 |

**අතිරේක තොරතුරු :**

- 2022.12.31 දිනට තොගය රු. 48 000 කි.
- යන්ත්‍ර වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.
- 2022.12.31 දිනට ගෙවිය යුතු විදුලි ගාස්තු රු. 2 000 කි.

**අවශ්‍ය වන්නේ :**

(අ) සොනාලිගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2022.12.31 දිනට සොනාලිගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

www.e-kalvi.com

**7.**

(i)

| ලැබීම් හා ගෙවීම් ගිණුම | ආදායම් හා වියදම් ගිණුම |
|---|---|
| • මුදල් පොතට බොහෝ දුරට සමානයි.<br>• මුදල් පදනම මත පිළියෙල කරයි.<br>• මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරයි.<br>• කාලච්ඡේදය තුළ සියලුම මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරයි.<br>• කාලච්ඡේදයේ අවසාන ශේෂය අත ඉතිරි මුදල් ශේෂය ලෙස පෙන්නුම් කරයි. | • ලාභ හෝ අලාභ ප්‍රකාශයට/ලාභාලාභ ගිණුමට බොහෝ දුරට සමානයි.<br>• උපචිත පදනම මත පිළියෙල කරයි.<br>• ආදායම් හා වියදම් පමණක් සටහන් කරයි.<br>• කාලච්ඡේදයට අදාළ සියලුම ආදායම් හා වියදම් සටහන් කරයි.<br>• අවසාන ප්‍රතිඵලය අතිරික්තය හෝ ඌනතාව ලෙස පෙන්නුම් කරයි. |

1x2 (2)

*(01 × 2 = ලකුණු 02 යි)*

(ii)

(අ) ලද සාමාජික මුදල් = රු. 138 000

*(ලකුණු 01 යි)*

**<u>පෙරවැඩ</u>**

230 (½) × රු. 600 (½) = රු. 138 000

(ආ) වර්ෂයට අදාල සාමාජික මුදල = රු. 150 000

*(ලකුණු 01 යි)*

**<u>පෙරවැඩ</u>**

250 (½) × රු. 600 (½) = රු. 150 000

(iii)

(අ)

**සොනාලි ව්‍යාපාරය**
**2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** (½)
**ලාභ හෝ අලාභ ප්‍රකාශනය**

| | රු | රු | | රු | රු |
|---|---|---|---|---|---|
| 2022.01.01 තොගය | | 80 000 | විකුණුම් | | 538 000 |
| එකතු කළා : ගැනුම් | 360 000 | | | | |
| ගෙනඒමේ කුලී | 18 000 | 378 000 | | | |
| විකිණීමට ඇති තොගයේ පිරිවැය | | 458 000 | | | |
| අඩු කළා : 2022.12.31 තොගය | | (48 000) (½) | | | |
| විකුණුම් පිරිවැය | | 410 000 (½) | | | |
| දළ ලාභය ප/ගෙ | | 128 000 (½) | | | |
| | | 538 000 | | | 538 000 |
| | | | දළ ලාභය ඉ/ගෙ | | 128 000 |
| **බෙදාහැරීම් වියදම්** | | | | | |
| බෙදාහැරීමේ වියදම් | 6 000 | | | | |
| ප්‍රචාරණ වියදම් | 6 300 | 12 300 | | | |
| **පරිපාලන වියදම්** | | | | | |
| යන්ත්‍ර ක්ෂය | 20 000 (½) | | | | |
| විදුලි ගාස්තු | 14 000 (½) | | | | |
| ගොඩනැගිලි කුලී | 20 000 | 54 000 | | | |
| **මූල්‍ය හා වෙනත් වියදම්** | | | | | |
| බැංකු ගාස්තු | 2 200 | | | | |
| බැංකු ණය පොලී | 8 000 (½) | | | | |
| බැංකු අයිරා පොලී | 500 | 10 700 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට බැර කළා | | 51 000 (½) | | | |
| | | 128 000 | | | 128 000 |

(ලකුණු 04 යි)

(ආ)

සෙනාලි ව්‍යාපාරය

2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (½)

| | රු. | රු. | **ජංගම නොවන වත්කම්** | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. (½) |
|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය 2022.01.01 | 300 000 | | යන්ත්‍ර | 200 000 | 20 000 (½) | 180 000 |
| එකතු කළා - ශුද්ධ ලාභය (½) | 51 000 | 351 000 | ලී බඩු උපකරණ | 180 000 | - | 180 000 |
| | | | | 380 000 | 20 000 (½) | 360 000 |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| 8% බැංකු ණය | | 100 000 | **ජංගම වත්කම්** | | | |
| **ජංගම වගකීම්** | | | තොගය | | 48 000 | (½) |
| ණයහිමියෝ | 50 000 | | ණයගැතියෝ | | 70 000 | |
| ගෙවිය යුතු විදුලි ගාස්තු | 2 000 (½) | | මුදල් | | 45 000 | 163 000 |
| ගෙවිය යුතු ණයපොලි | 8 000 (½) | | | | | |
| බැංකු අයිරාව | 12 000 | 72 000 | | | | |
| | | 523 000 | | | | 523 000 |

(ලකුණු 04 යි)

| 07 | (i) | (ii) | | (iii) | | 12/12 |
|---|---|---|---|---|---|---|
| | | අ | ආ | අ | ආ | |
| | 02 | 01 | 01 | 04 | 04 | |

www.e-kalvi.com

(iii)

(අ)

**සොනාලි ව්‍යාපාරය**
**2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලාභ හෝ අලාභ ප්‍රකාශනය** (½)

| | රු. | රු. | රු. | |
|---|---|---|---|---|
| විකුණුම් | | | | |
| අඩුකළා - විකුණුම් පිරිවැය : | | | 538 000 | |
| 2022.01.01 දිනට තොගය | | 80 000 | | |
| එකතු කළා - ගැනුම් | 360 000 | | | |
| ගෙන ඒමේ කුලී | 18 000 | 378 000 | | |
| විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය | | 458 000 | | |
| අඩුකළා - 2022.12.31 දිනට ඉතිරි තොගය | | (48 000) | | (½) |
| විකුණුම් පිරිවැය [illegible] | | | (410 000) | (½) |
| දළ ලාභය | | | 128 000 | (½) |
| අඩුකළා වියදම් : | | | | |
| **බෙදාහැරීමේ වියදම් :** | | | | |
| බෙදා හැරීමේ වියදම් | 6 000 | | | |
| ප්‍රචාරණ වියදම් | 6 300 | | | |
| | | 12 300 | | |
| **පරිපාලන වියදම් :** | | | | |
| යන්ත්‍ර ක්ෂය | 20 000 (½) | | | |
| විදුලි ගාස්තු | 14 000 (½) | | | |
| ගොඩනැගිලි කුලී | 20 000 | 54 000 | | |
| **මූල්‍ය හා වෙනත් වියදම් :** | | | | |
| බැංකු ගාස්තු | 2 000 | | | |
| බැංකු ණය පොලී | 8 000 (½) | | | |
| බැංකු අයිරා පොලී | 500 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා | | | 51 000 | (½) |

*(ලකුණු 04 යි)*

www.e-kalvi.com

(ආ)

**සොනාලිගේ ව්‍යාපාරය**
**2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** (½) (½)

| | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් : | | | |
| යන්ත්‍ර | 200 000 | 20 000 | (½) 180 000 |
| ලී බඩු උපකරණ | 180 000 | - | 180 000 |
| | 380 000 | 20 000 | (½) 360 000 |
| ජංගම වත්කම් | | | |
| තොගය | | 48 000 (½) | |
| ණයගැතියෝ | | 70 000 | |
| මුදල් | | 45 000 | 163 000 |
| මුළු වත්කම් | | | 523 000 |
| 2022.01.01 ප්‍රාග්ධනය | | 300 000 | |
| එකතු කළා - ශුද්ධ ලාභය | | (½) 51 000 | 351 000 |
| ජංගම නොවන වගකීම් : | | | |
| 8% බැංකු ණය | | | 100 000 |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | | 50 000 | |
| ගෙවිය යුතු විදුලි ගාස්තු | | 2 000 (½) | |
| බැංකු අයිරාව | | 12000 | |
| ගෙවිය යුතු බැංකු ණය පොළී | | 8000 (½) | 72 000 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 523 000 |

*(ලකුණු 04 යි)*

| 07 | (i) | (ii) | | (iii) | | 12/12 |
|---|---|---|---|---|---|---|
| | | අ | ආ | අ | ආ | |
| | 02 | 01 | 01 | 04 | 04 | |

www.e-kalvi.com

****